සැ. යු. — 2012.09.07 දින පළ වූ අංක 1,775 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,776 - 2012 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2012.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1448 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අගෝස්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

සිරිලක ප්‍රජා ශාන්ති පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අගෝස්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

බී. කේ. එස්. රවීන්ද්‍ර,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1447- B 80647 — 7,200 (2012/09)
F1-

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරන වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ කරනු ලබන නිවේදනය

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ, සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය අතුල සරත් කුමාර විජේසිංහ වන මම, වයඹ පළාත් සභාවේ 1995 අංක 05 දරන වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 03 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, සංස්ථාපනය කරන ලද වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවට එකී ප්‍රඥප්තියේ 05 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත නම් සඳහන් තැනැත්තන් 2012.08.01 දින සිට 2015.07.31 වැනි දින දක්වා කාලය සඳහා වයඹ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කරන ලද බැව් මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී ප්‍රඥප්තියේ 07 වැනි වගන්තියේ ප්‍රකාර ඉහත කී කොමිෂන් සභාවේ සභාපති වශයෙන් වෙල්ලාලගේ දොන් හෙන්රි චන්ද්‍රරත්න මහතා 2012.08.01 වැනි දින සිට 2015.07.31 වැනි දින දක්වා කාලය සඳහා පත් කරන ලද බව ද, මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා
සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන,
පරිසර, සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ,
සමූපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ අමාත්‍ය (වයඹ පළාත).

2012 අගෝස්තු මස 09 වැනි දින.

| | *නම* | *ලිපිනය* |
|---|---|---|
| 1. | වෙල්ලාලගේ දොන් හෙන්රි චන්ද්‍රරත්න මයා | කිරිදිගල්ල, ඉබ්බාගමුව. |
| 2. | ගුණවීර විජේසිංහ මයා | සුන්දරාපොල පාර, යන්තම්පලාව, කුරුණෑගල. |
| 3. | නුවර පක්ෂගේ කුලතුංග මයා | "උදේනි", වත්තේගෙදර, වැල්ලව. |

09-265

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.